# පුරප්පාඩු

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින උපාධිධාරී භාෂා පරිවර්තක (II ශ්‍රේණිය) දෙමළ තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2021.07.26 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## උපාධිධාරී භාෂා පරිවර්තක (II ශ්‍රේණිය) දෙමළ - Graduate Translator (Grade II) Tamil

**සුදුසුකම් :**

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් දෙමළ විෂයයක් සහිතව ලබාගත් උපාධිය

සහ

02. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) හෝ වෙනත් උසස් විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා සමත්වී තිබීම.

**සැ. යු :** දෙමළ භාෂාව සිංහල භාෂාවට පරිවර්තනය කිරීම සහ සිංහල භාෂාව දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමේ හැකියාව තිබීම මෙන්ම ඉංග්‍රීසි, සිංහල හා දෙමළ යන භාෂා තුන සඳහාම මනා දැනුම ඇති අයදුම්කරුවනට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

**වැටුප් පරිමාණය :** රු. 42,885 - 18 x 660 - 54,765 (මාසික) U-MN 3 (II)

(මෙම වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**සේවා කොන්දේසි :**

වයස අවුරුදු 18 - 45 ත් අතර විය යුතුය. (රාජ්‍ය සේවය, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ස්ථිර සේවකයින් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ)

අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක මුදලක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම්වලින් 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුපටද, 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලටද බැර කරනු ලැබේ. එයට අමතරව 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවක භාරකාර අරමුදලටද බැර කරනු ලැබේ.

**අයදුම්පත් එවිය යුතු ආකාරය :**

අයදුම්කරුවන් විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික පිටපත්ද සමග **සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට 2021.07.26 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මීට අදාළව අයදුම්පත සහ අනෙකුත් තොරතුරු විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන www.sjp.ac.lk වෙතින් ලබාගත හැකිය.

විශ්වවිද්‍යාල සේවයේ / රාජ්‍ය දෙපාර්තමේන්තුවක / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම, අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**
**2021.07.08**